සියලු හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය - 2025

# ඉතිහාසය

6 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියා දක්වන්න.

01. මහා වංශය ක්‍රි.ව. ........................................................................ ලියූ මූලාශ්‍රයකි.
(5 වන සියවස / 6 වන සියවස / 4 වන සියවස)

02. ක්‍රිස්තු වර්ෂයෙන් ........................................ දී ශක වර්ෂ ක්‍රමය ආරම්භ වේ. (544 / 78 / 611)

03. මුලින්ම ගොඩබිම ශාක වර්ග පැතිරී ගිය යුගය ........................................ යුගය වේ.
(සිලූරියන් / පැලියොසොයික / මහා හිම)

04. මානව පරිණාමය සිදුවූයේ ........................................................................ යුගයේ දී ය.
(පුරා ශිලා / මධ්‍ය ශිලා / මහා හිම)

05. මිනිසා විසින් ආදි කාලයේ සිට නිපදවූ ගල් මෙවලම්වල ස්වරූපය වෙනස් කළ ආකාරය තුළින් ........................................ වෙනස්වීම පැහැදිලි වේ. (මානව / සංස්කෘතික / ජීවන)

- අංක 06 - 10 තෙක් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. භාණ්ඩ හුවමාරුව පුරා ශිලා යුගයේ දී ආරම්භ වූයේ ඇටසැකිලි මත වර්ණ ආලේප කරන චාරිත්‍රය නිසයි. ( )

07. ගම්මාන බිහිවූයේ පුරා ශිලා යුගයේ දී ය. ( )

08. ගොවිතැනට හා සත්ත්ව පාලනයට පෙලඹීම නිසා මිනිසාට ශිෂ්ටාචාර තනාගැනීමේ හැකියාව ලැබිණි. ( )

09. ඔස්ට්‍රලොයිඩ් ඇමෙරිකාවට අයත් වූ මානව වර්ගයකි. ( )

10 වී වගාව මුල් වරට ආරම්භ වූයේ චීනයේ ය. ( )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11. මිනිසුන්ට ගොවිතැන් කටයුතු ආරම්භ කිරීමට පසුබිමක් ඇතිවූයේ,
(1) ලෝකයේ සිසිල් දේශගුණය නිසයි.
(2) ලෝකයේ දේශගුණය උණුසුම් වීම නිසයි.
(3) නිවාස තැනීම ආරම්භ කළ නිසයි.
(4) සත්ත්ව පාලනයට පෙලඹීම නිසයි.

12. උතුරු ඇමෙරිකාව හා ග්‍රීන්ලන්තය යන ප්‍රදේශවල සිටින මානව වර්ගය හඳුන්වන්නේ,
(1) නීග්‍රොයිඩ් (2) මොන්ගොලයිඩ් (3) කොකසයිඩ් (4) ඔස්ට්‍රලොයිඩ්

13. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය බිහිවූයේ මින් කවර ගංගා ආශ්‍රිත ව ද?
(1) හොවැංහෝ, සිකියැං ගංගා (2) කොංගෝ ගංගා
(3) නයිල්, නයිජර් ගංගාව (4) යුප්‍රටීස්, ටයිග්‍රිස් ගංගා

14. ලෝකයේ පැරණිම සාහිත්‍ය කෘතිය ලිවීමට භාවිත කළ අක්ෂර වර්ගය,
(1) කූන්‍ය අක්ෂර (2) මුද්‍රා අක්ෂර (3) චිත්‍රාක්ෂර (4) රූපාක්ෂර

15. ඉන්දු නිම්න ප්‍රදේශයට අයත් වර්තමාන රටවල් වන්නේ,

(1) චීනය හා ජපානය (2) පාකිස්ථානය හා ඇෆ්ගනිස්ථානය

(3) ඊජිප්තුව හා අරාබිය (4) ඉරාකය හා ඉරානය

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස් තැන මත ලියන්න.

16. මුද්‍රණ යන්ත්‍රය මුලින් ම ලෝකයට හඳුන්වා දෙන ලද්දේ ............................ ජනයා විසිනි.

17. ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ............................ වේ.

18. මමීකරණ ක්‍රමය යනු ............................ කල් තබාගැනීමේ ක්‍රමයකි.

19. තැන තැන ඇවිදිමින් පලවැල නෙළාගැනීම ආහාර සොයාගැනීමට ............................ යුගයේ අනුගමනය කළ ක්‍රමයකි.

20. අපේ රට ජනාවාස වන්නේ මීට අවුරුදු ............................ පමණ ඉහත කාලයකදී ය.

(ල. 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අංක 02 - 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01. (1) (i) මෙම රූපයේ දැක්වෙන පැරණි වානරයා හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(ii) එම වානරයා සිටි කාලය දක්වන්න. (ල. 01)

(iii) ඔහු කළ විශේෂ කාර්යයක් දක්වන්න. (ල. 02)



(2) (i) මෙම චිත්‍ර දක්නට ලැබෙන රට කුමක් ද? (ල. 01)

(ii) මෙම චිත්‍ර කුමන යුගයකට අයත් ද? (ල. 01)


(iii) මෙම යුගයේ කළ මෙම කාර්යයට අමතරව කරන ලද තවත් කාර්යයන් 2 ක් දක්වන්න. (ල. 02)



(3) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ල. 01)

(ii) ඒවා පිහිටි ශිෂ්ටාචාරය නම් කරන්න. (ල. 01)

(iii) එම පින්තූරයේ දැක්වෙන ස්ථාන සඳහා උදාහරණ 2 ක් දක්වන්න. (ල. 02)




(4) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ මොනවා ද? (ල. 01)


(ii) ඒවා පවතින රටක් ලියන්න. (ල. 01)

(iii) ඒවා කුමක් සඳහා භාවිත කරන ලද්දේ ද? (ල. 01)

(iv) ඒවා නිර්මාණය කළ ශිෂ්ටාචාරය දක්වන්න. (ල. 01)





02. (1) මෙම සටහනේ දැක්වෙන ක්‍රිස්තු වර්ෂ හා බුද්ධ වර්ෂ ක්‍රමයට සිදු වූ ප්‍රධාන ඓතිහාසික සිද්ධි දී ඇති අක්ෂර අනුව නම් කරන්න. (ල. 07)




(2) ශක වර්ෂ ක්‍රමය හා හිජ්රි වර්ෂ ක්‍රමය ආරම්භ වූ ආකාර ලියා දක්වන්න. (ල. 04)

03.


A


B


(1) මෙම පින්තූර දෙකින් දැක්වෙන්නේ කුමක් ද? A හා B වෙන වෙන ම දක්වන්න. (ල. 04)

(2) B සොයාගත් රට දක්වන්න. (ල. 02)

(3) මේවා පිළිබඳව ඔබ දන්නා කරුණු 2 බැගින් ලියන්න. (ල. 04)

(4) A රූපය බිහි වූ කාලය දක්වන්න. (ල. 01)

04.


A B C

(1) මෙම රූපවල දැක්වෙන්නේ මිනිසා පරිණාමය වූ ආකාර වේ. එම අවස්ථාවල ඔවුන් හැඳින් වූ නම් දක්වන්න. (ල. 03)

(2) මෙහි B හා C අවස්ථාවල මිනිසා කළ සුවිශේෂී කාර්යයන් 2 බැගින් ලියන්න. (ල. 04)

(3) C වලින් දැක්වෙන මිනිසා ඊට පෙර සිටි අයට වඩා වෙනස් වන්නේ කෙසේදැයි කරුණු 2 ක් දක්වන්න. (ල. 04)

05. (1) දීර්ඝ කාලයක් තුළ අතීත මිනිසාගේ ජීවිතය හැඩගස්වා ගැනීමට හේතු වූ වෙනස්වීම් 3 ක් දක්වන්න. (ල. 03)

(2) මිනිසාගේ සංස්කෘතික දියුණුව අනුව ප්‍රධාන අවධි තුන දක්වා ඒවාහි පැවති ලක්ෂණ පහත මාතෘකා යටතේ දක්වන්න. (ල. 08)

| | අවධි | ආහාර | නිවාස | කළ කටයුතු |
|---|---|---|---|---|
| 1. | පුරා ශිලා යුගය | ........................ | ........................ | ........................ |
| 2. | මධ්‍ය ශිලා යුගය | ........................ | ........................ | පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම |
| 3. | ........................ | ගොවිතැන හා සත්ත්ව පාලනය | ........................ | ........................ |

06. (1) ගොවිතැන් කටයුතු ආරම්භ කළ ආදි මිනිසා සිදුකළ වගාවන් අනුව පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 06)

| වගාව | ආරම්භක රට | කාලය |
|---|---|---|
| වී | ........................ | ........................ |
| ........................ | මධ්‍යධරණී ප්‍රදේශය | ........................ |
| ........................ | ........................ | වසර 5000 කට පෙර |

(2) මානව පරිණාමයෙන් පසුව බුද්ධිමත් මිනිසා දක්වා සිදුවූ විශේෂ සිදුවීම් කීපයක් මෙහි දක්වා ඇත. ඒවා නිවැරදි ලෙස පෙළ ගස්වන්න. (ල. 05)

A ශිෂ්ටාචාර තනාගැනීම.

B සංගීතයට යොමුවීම.

C නිවාස ඉදිකිරීම.

D වරිච්චි ගෙවල් තැනීම.

E ගොවිතැනට අවශ්‍ය උපකරණ සෑදීම.

07. (1) පහත දැක්වෙන වර්තමාන ප්‍රදේශවලට අයත් වූ පැරණි ශිෂ්ටාචාර නම් කරන්න.

1. ඉරාකය
2. නයිල් නිම්නය
3. පකිස්ථානය

(ල. 03)

(2) මෙම නිර්මාණයන් හා ක්‍රියාකාරකම් අයත්වන පැරණි ශිෂ්ටාචාරය නම් කරන්න.

1. සෙල්ලම් මැටි කරත්තය
2. නෙෆටීටි රැජින
3. සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා
4. පිලිස්සූ මැටි ගඩොල් භාවිතය
5. සතුන් යොදා සී සෑම

(ල. 05)

(3) පැරණි ශිෂ්ටාචාරවල සිටි මෙම පුද්ගලයන් පිළිබඳව ඔබ දන්නා කරුණු 1 බැගින් ලියන්න.

1. ගිල්ග - මෙෂ් රජු 2. ඇසිරියන්වරු 3. එස්ලිලි (ල. 03)

## 2025 - දෙවන වාර පරීක්ෂණය - ඉතිහාසය - 06 ශ්‍රේණිය    පිළිතුරු පත්‍රය

### I - කොටස

5 වන සියවස    02. 78    03. පැලියොසොයික    04. මහා හිම    05. සංස්කෘතික
✓    07. ×    08. ✓    09. ×    10. ✓    11. 2    12. 3    13. 4
1    15. 2    16. චීන ශිෂ්ටාචාරය    17. කෘෂිකර්මය    18. මළ සිරුරු
දඩයම්    20. එක් ලක්ෂ විසි දාහක්    (ලකුණු 40)

### II කොටස

(1) (i) ඔස්ට්‍රලෝපිතකස් (ල. 01)
(ii) වසර ද.ල. 2.5 ට පෙර (ල. 01)
(iii) දෙපයින් ඇවිද යාම, ඇට වර්ග ගලින් තළා ආහාරයට ගැනීම (ල. 02)
(2) (i) ඉන්දියාව (ල. 01)
(ii) මධ්‍ය ශිලා යුගය (ල. 02)
(iii) කාර්යයන් දැක්වීමට (ල. 02)
(3) (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගරයක් (ල. 01)
(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගරයක් (ල. 01)
(iii) හරප්පා, ඩොලවීර, මොහෙන්ජොදාරෝ (ල. 02)
(4) (i) පිරමීඩ
(ii) ඊජිප්තුව
(iii) පාරාවෝ රජවරුන්ගේ මෘත දේහ තැන්පත් කිරීමට
(iv) ඊජිප්තු ශිෂ්ටාචාරය (ල. 04)

(1) A බුදුන් වහන්සේගේ පරිනිර්වාණය    B ක්‍රිස්තුස් වහන්සේගේ උපත
C වසභ රජුගේ කාලය ආරම්භය    D මහසෙන් රජුගේ කාලය ආරම්භය
E බුදුන් වහන්සේගේ පරිනිර්වාණය    F ක්‍රිස්තුස් වහන්සේගේ උපත
G මහසෙන් රජුගේ කාලය ආරම්භය (ල. 07)
(2) සිදුවූ ආකාරය දැක්වීම. (ල. 04)

(1) A ප්‍රොකායෝට් බැක්ටීරියාව    B ඔපබීනියාවකුගේ සලකුණක් (ල. 04)
(2) B කැනඩාව (ල. 01)
(3) කරුණු දැක්වීමට (ල. 04)
(4) වසර දශ ලක්ෂ 2500 කට පෙර (ල. 02)

(1) A ඔස්ට්‍රලෝපිතකස්    B හෝමෝ පැබිලස්    C හෝමෝ සාපියන් (ල. 03)
(2) කාර්යයන් දැක්වීමට (ල. 04)
(3) සාරවත් දේ නිපදවීම, චිත්‍ර ඇඳීම, භාෂා භාවිතය, හැඟීම ප්‍රකාශ කිරීම ආදිය (ල. 04)

(1) ගල් මෙවලම්, වාසස්ථාන, ආහාර (ල. 03)
(2) සුදුසු පරිදි වගුව සම්පූර්ණ කිරීමට (ල. 08)

(1) සුදුසු පරිදි සම්පූර්ණ කිරීමට (ල. 06)
(2) C, E, D, B, A (ල. 05)

(1) ඉරානය - මෙසපොතේමියානු / නයිල් නිම්න - ඊජිප්තුව / පාකිස්ථානය - ඉන්දු නිම්න (ල. 03)
(2) ශිෂ්ටාචාර දැක්වීමට (ල. 05)
(3) කරුණු දැක්වීමට (ල. 03)